# සඳුදා

## පළමුවන කියැවීම

දානියෙල් දිවැසිවරයාගේ වෙනත් කතා වලින් ගත් පාඨ කීපයකි.
දානියෙල් (ද්.ස.ග්‍ර) 2: 1-9, 15-17, 19-20, 33-62 හෝ 2: 41-62

**"නිදොස් මට මරණය හිමි වේද?"**

(බබිලෝනියාවේ ජුවකීම් නමැති මිනිසෙක් ජීවත් විය. ඔහු ඉතා රූමත් කාන්තාවක් වූ හිල්කියාගේ දුව වන සුසන්නා සරණ පාවාගෙන සිටියේය. ඇගේ දෙමාපියන් දැහැමි අය වූ බැවින් ද ඔවුන් ඇයට මෝසෙස්ගේ ව්‍යවස්ථාව හොඳින් උගන්වා තිබුණු බැවින් ද ඇ දෙවියන් වහන්සේට ගරු බිය පාන කාන්තාවක් වූවාය. ජුවකීම් ඉතා ධනවත් කෙනෙක් වූ බැවින් සිය නිවස යාබද උයනක් ඔහුට තිබිණි. අන් කිසිවෙකුට වඩා ඔහුට සෙනග ගරු බුහුමන් කළ බැවින් ජුදෙව්වරු බොහෝ විට ඔහු බැහැදැකීමට පැමිණියහ. ඒ අවුරුද්දේ විනිශ්චයකාරයන් වශයෙන් ක්‍රියා කිරීමට සෙනග අතුරින් වයසක මිනිසුන් දෙදෙනෙකු තෝරාගෙන තිබිණි. මිනිසුන් හට මඟ පෙන්වන අය මෙන් බොරුවට ඉදිරිපත් වන වයසක අය සහ විනිශ්චයකාරයන් මගින් බබිලෝනියට දුෂ්ඨකම පැමිණියේ යයි ස්වාමීන් වහන්සේ වදාරා ඇත්තේ මොවුන් ගැනය. ඒ මිනිසුන් දෙදෙන බොහෝ විට ජුවකීම්ගේ ගෙදර වූහ. නඩු ඉදිරිපත් කිරීමට පැමිණි සියල්ලෝම ඔවුන් වෙත ආහ.

මද්දහනේ දී සියලු දෙන ඉවතට ගිය පසු තම සැමියාගේ උයනේ සක්මන් කිරීම සුසන්නාගේ සිරිතක් විය. ඇ සක්මන් කරනු සඳහා දිනපතා එනු දුටු අය ඒ වයස මිනිසුන් දෙදෙනා ද, ක්‍රමක්‍රමයෙන් ඇයට ආලය කිරීමට පටන්

ගත්හ. සිහි නුවණ පසෙක දමා යහ මග යාමට ඔව්හු කිසි උත්සාහයක් නොකර සත් ගුණවත් පැවැත්මේ අවශ්‍යතාවයන් අමතක කළහ. මෙලෙස ඔව්හු හොඳ ප්‍රස්ථාවක් බලාගෙන සිටියෝය.

සුසන්තා ද දිනක් සිරිත් පරිදි සේවිකාවන් දෙදෙනෙකු සමග ආවා ය. එදින අව් රශ්නය තද දිනයක් වූ බැවින් උයන තුළ ඇයට ස්නානය කිරීමට වුවමනා විය. සැඟවුණු ස්ථානයක සිට ඇ දෙස ඔත්තුවක් බලා සිටි වයසක දෙදෙනා ඇර වෙන කිසිවෙක් එහි නොවීය. ඇ ද සේවිකාවන් අමතා "මට තෙල් ටිකක් සහ සුවඳාලේපනය ටිකක් ගෙනෙන්න. මා ස්නානය කරන විට උයනේ දොරටුව වසා දමන්නැ"යි කීවාය. සේවිකාවන් ගිය විගස ම වයසක මිනිසුන් දෙදෙනා ඇය වෙත දිව ආහ. ඔව්හු ඇයට කතා කොට "මේ බලන්න. උයනේ දොරටු වසා දමා ඇත. කාටවත් අපව නොපෙනේ. ඔබ සමග සැතපීමට අපි කැමතිය. ඒ නිසා අපට ඉඩ දෙන්න. ඉඩ නොදුනහොත් තරුණයෙකු ඔබ සමග සිටි බවටත් ඔබ සේවිකාවන් ඒ නිසාම යන්නට හැරිය බවටත් අපි දෙදෙනාම සාක්ෂි දෙන්නෙමු"යි කීහ. එවිට සුසන්තා සුසුම් හෙලා කථා කරමින් "මා කුමක් කළත් උගුලට අසු වී ඇත. මා ඔවුන්ට එකග වුණොත් මට මරණය නියතය. මා විරුද්ධ වුනොත් මට ඔබගෙන් පලා යන්න බැරි වනු ඇත. එහෙත් ස්වාමින් වහන්සේට විද්ධව පව් කරනවාට වැඩියෙන් ඔබගේ බලයට නිදොස්ව අසුවෙන්න කැමති වෙමි"යි කීවාය. මෙසේ කියා ඇ පුලුවන් තරම් මහ හඬින් කෑගැසුවා ය. වයසක මිනිසුන් දෙදෙනා ද ඇට දොස් පවරමින් කෑ ගසන්නට වූහ. මෙසේ කෑ ගසා ඔවුන්ගෙන් එක් කෙනෙක් උයනේ දොරටුව ඇර දිව ගියේය. ගෙවැසියෝ ද උයනේ කෑ ගැසීම අසා සිදුවන දේ කුමක්ද කියා බලනු පිණිස නිවසේ පැත්තක පිහිටි දොරින් දිව ආහ. වයසක මිනිසුන් දෙදෙනා ඔවුන්ගේ කථාව කී පසු සේවකයෝ ලැජ්ජාවට පත් වූහ. මන්ද සුසන්තා ගැන මෙවැනි දෙයක් කිසිදාක ඔවුන් නොඇසූ බැවිනි.

පසු දින ඇගේ සැමියා වන ජුවකිම්ගේ ගෙදර රැස්වීමක් පවත්වන ලදි. වයසක දෙදෙනා ද ඇය මරණයට පත් කිරීමට තීරණය කොට පළිගැනීමේ චේතනාවෙන් පැමිණියහ. ඔව්හු පිරිස අමතා “ජුවකිම්ගේ බිරිඳ වන හිල්කියාගේ දුව සුසන්නා කැඳවන්නැ” යි කීහ. ඇයට එය දන්වන ලදි. ඇය ද ඇගේ දෙමාපියන් ද ඇගේ දරුවන් ද නෑදෑ සියල්ලන් ද කැටුව පැමිණියාය.

ඇයගේම සෙනග ද ඇය දුටු සියලු දෙනා ද වැලපෙන්නට වූහ. එවිට මේ වැඩිමහල්ලන් දෙදෙනා මුළු සෙනග ඔවුන් වටේට සිටගත් පසු නැගිට ඔවුන්ගේ අත් ඇයගේ හිස මත තැබූහ. ඈ ද කඳුළු සලමින් දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු ඇතිව ඇගේ නෙත් ස්වර්ගය දෙස යොමු කළාය. එවිට වැඩිමහල්ලන් දෙදෙනා කතා කොට “අපි දෙදෙනා තනිව උයන ළඟින් ඇවිදින විට මේ ස්ත්‍රී සේවිකාවන් දෙදෙනා සමග පැමිණියාය. ඉන්පසු ඈ උයනේ දොරටුව වසාදමා සේවිකාවන් යන්නට හැරියාය. ඒ අවස්ථාවේදී සැඟවී සිටි එක්තරා තරුණයෙක් අවුත් ඇය සමග සැතපුණේය. උයනේ කොණක සිටි අපි මේ අපරාධය දුටු විට ඔවුන් වෙත ඉක්මණින් ගියෙමු. ඔවුන් දෙදෙන එකට සිටිනවා දුටු නමුත් අපට ඒ මිනිසා අල්ලන්නට නොහැකි විය. ඔහු අපට වඩා ශක්ති සම්පන්න කෙනෙක් විය. ඔහු දොරටුව ඇරගෙන දුවන්නට විය. එහෙත් අපි ස්ත්‍රිය අල්ලාගෙන ඒ තරුණයා කවරෙක් ද කියා ඇසූ නමුත් ඈ අපට උත්තර නුදුන්නාය. මෙය අපේ සාක්ෂිය”යි කීය.)

ඔවුන් ප්‍රජා මූලිකයන් සහ විනිශ්චයකාරයන් වූ බැවින් පිරිස ඔවුන් කී දේ විශ්වාස කළහ. සුසන්නා ද මරණයට නියම කරනු ලැබුවාය. ඈ ද මහ හඬින් කෑගසා “සදාතන දෙවියනි, ඔබ සියලු රහස් ද යමක් සිදුවීමට පෙර සියල්ල ද දන්නා සේක. ඔවුන් මට විරුද්ධව බොරු සාක්ෂි කියා ඇති බව ඔබ දන්නා සේක. මට විරුද්ධව ඇති ඔවුන්ගේ වෛරය නිසා මා නිදොස් වුව ද, මට දැන් මරණය නියත ය” යි කීවාය. ස්වාමීන් වහන්සේ

ද ඇගේ ඉල්ලීමට සවන් දුන් සේක. ඇය මෙසේ මරණයට ගෙන යනු ලැබූ විට උන් වහන්සේ දානියෙල් නම් එක්තරා තරුණ ළමයෙකු මේ ක්‍රියාවට විරුද්ධව නැගී සිටීමට පෙළඹ වූ සේක. මොහු කෑ ගසමින් “මේ ස්ත්‍රියගේ මරණය ගැන මට වගකීමක් නැතැ”යි කීය. එවිට සියලු දෙනා ඔහු වෙත හැරී ඔහුට කතා කොට “ඔබ මේ කියන දේවල තේරුම කුමක්දැ”යි විචාළහ. ඔහු ද ඒ මහ පිරිස මැද සිටගෙන ඔවුන්ට පිළිතුරු දෙමින් “ඉශ්රායෙල් ජනයෙනි, ඉශ්රායෙල් දියණියක් කියන දේ නොඅසා ඇත්ත සොයා ගැනීමට උත්සාහ නොකර ඇය මරණයට තීන්දු කිරීමට තරම් ඔබ මහා මෝඩයෝ ද? ඔබ සියලු දෙනා නඩුව විමසූ ස්ථානයට ආපසු යන්න. මේ මිනිසුන් ඇයට විරුද්ධව බොරු සාක්ෂි දී ඇතැ”යි කීවේය.

එවිට සියල්ලෝ ඉක්මන් කොට ආපසු ගියහ. වැඩිමහල්ලෝ ද දානියෙල්ට කතා කොට, “දෙවියන් වහන්සේ ප්‍රජා මූලිකයන්ට දී තිබෙන වරම ඔබටත් දී තිබෙන බැවින් එන්න අප සමග වාඩි වී ඔබ කියන දේවල තේරුම කුමක් ද කියා කියන්නැ”යි කීහ.

එවිට දානියෙල් කතා කොට “මේ දෙදෙනාගෙන් මට ප්‍රශ්න කිරීමට වුවමනා බැවින් ඔවුන් දෙදෙනා වෙන් කොට තබන්නැ”යි කීය. ඔවුන් වෙන් කළ පසු ඔවුන්ගෙන් කෙනෙකු ඔහු තමා වෙත කැඳවා ඔහුට කතා කොට “ඔබ දුෂ්ටකමෙහි වයසට පත්වී ඇත. දැන් ඔබේ පරණ පාපවලට ඔබ වසඟ වී සිටින්නෙහි ය. නිදොස් වූ ද, දැහැමි වූ ද අය මරණයට පත් නොකරන්නැ”යි සමිඳාණන් වහන්සේ කියා ඇති නමුත් ඔබ ඔහුගේ අසාධාරණ තීන්දුවලින් නිදොස් අය මරණයට පාවා දී වැරදිකරුවන් නිදොස් කරන්නහු ය.

“ඔබ ඇය ඉතා පැහැදිලිව දුටු බැවින් ඔවුන් සැතපී සිටියේ කුමන ගසක් යට ද කියා මට කියන්නැ”යි කීය. ඔහුද පිළිතුරු දෙමින් “සියඹලා ගසක් යට ය”යි කීය. දානියෙල් ද කතා කොට “ඔබ කතා කළා ඇති. ඔබ කී

බොරුව ඔබේම හිස පිටට ම ඒවි. දෙවියන් වහන්සේගේ දූතයා උන් වහන්සේගෙන් ඔබ ගැන තීන්දුව ලබාගෙන දැන් ඔබ දෙකට පලා දමනු ඇතැ"යි කීය. ඉන්පසු ඔහු ඒ මිනිසා යන්නට හැර අනිත් වැඩිමහල්ලා තමා ළගට ගෙන්වා ගෙන ඔහු අමතා "ජුදා දේශයට නොව කානාන් දේශයට ජාතක වූ හැතිකරය, රූපශ්‍රීයෙන් ඔබ මුළා වී ඇත. කාමරාගය ඔබ මංමුළා කර ඇත. ඉශ්රායෙල් දියණියන් කෙරෙහි ඔබ ක්‍රියා කළේ මේ පිළිවෙලට ද? ඔව්හු ද ඔබට විරුද්ධව යාමට බිය වූහ. එහෙත් ඔබගේ දුෂ්ඨකමට හිස නොනමන ඉශ්රායෙල් දියණියක් මෙහි සිටියි. ඔබ ඔවුන් වෙත යනවිට ඔවුන් සිටියේ කුමන ගසක් යට ද කියා මට කියන්නැ"යි කීය. ඔහු ද පිළිතුරු දෙමින් "තුග ගසක් යට ය"යි කීය. දානියෙල් එවිට කතා කොට "ඔබත් කතා කළා ඇති.ඔබ කී බොරුව ඔබේ හිස පිටට ම ඒවි. ඔබ කඩුවකින් ගෙදර දක්නාගෙන ගොස් ඔබ දෙපලු කොට ඔබ දෙදෙනා මරා දමන පිණිස දෙවියන් වහන්සේගේ දූතයා බලා සිටින්නේ ය"යි කීවේය. එවිට මුළු මහා පිරිසම උන් වහන්සේ තුළ විශ්වාසය තබන ගැලවුම්කාර දෙවියන් වහන්සේට මහ හඬින් ප්‍රශංසා කළහ. ඉන්පසු ඔව්හු බොරු සාක්ෂි දීම නිසා දානියෙල් විසින් වරදට පත් කරනු ලැබූ වැඩිමහල්ලන් දෙදෙනාට විරුද්ධව හැරුණාහ. මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ නියම කර තිබෙන පරිදි සෙනග මේ මහල්ලන් දෙදෙනා විසින් ඔවුන්ගේ අසල්වැසියාට නියම කිරීමට අදහස් කර තිබුණු තීන්දුව ඒ දෙදෙනාටම නියම කළහ. මෙලෙස සෙනග ඒ දෙදෙනා මරණයට පත් කළහ. එහෙත් එදින නිදොස් කාන්තාවකගේ ජීවිතය බේරා ගන්නා ලදි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **23 : 1 – 6**

පිළිතුර: සමිඳුනි, ඔබ මා සමඟ බැවින් මට කිසි බියක් නොවන්නේය.

ගීය:

සමිඳාණෝ මා එඬේරාණෝ ය. අග හිඟ මට නොවන්නේය. එතුමාණෝ සුනිල් තණ බිම් මත මා සතපවා නිසල දිය වෙත මා පමුණුවා මා පණගන්වන සේක. සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දැමිටු මග මා ගෙන යන සේක.

මරණය වැනි ගන’ඳුරු රුදුරු නිම්නය මැදින් ගියත් ඔබ මා සමඟ බැවින් මට කිසි බියක් නොවන්නේය. ඔබේ කෙවිට ද සැරයටිය ද මා නියත සැනසිල්ල වන්නේය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී මංගල බොජුනක් පිළියෙල කර දී, මා සිරස තෙලින් ආලේප කරන සේක. මාගේ කුසලාන උතුරා යන්නේය.

ඔබේ දයාව හා කරුණාව නියතව දිවිහිමියෙන් මා අනුව එන්නේය. සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේය.

## සාධුකාරය

“ජීවනය දෙන්නේ ආත්මය වේ. මාංශයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වන්නේ ය”යි ස්වාමීන් වහන්සේ වදාළ සේක.”

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 8 : 1-11

### *ලෝකයේ ආලෝකය මම වෙමි.*

යළිත් අවස්ථාවක ජේසුස් වහන්සේ ජනතාවට කතා කොට, “ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ ය”යි වදාළ සේක. එවිට පරිසිවරු උන් වහන්සේට කතා කරමින් “ඔබ තමා ගැනම සාක්ෂි දරන්නෙහි ය. ඒ නිසා ඔබේ සාක්ෂිය වලංගු නැතැ”යි කීහ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් “මා ගැනම මා සාක්ෂි දරන නමුදු මාගේ සාක්ෂිය වලංගු ය. මන්ද මම කොතැනින් ආයෙම් ද, කොතැනට යන්නෙම් දැ යි දනිමි. එහෙත් මා එන්නේ කොතැනින් ද යන්නේ කොතැනට ද කියා ඔබ නොදන්නහු ය. ඔබ මනුෂ්‍ය මිම්මෙන් විනිශ්චය කරන්නු ය. මම කිසිවෙකු විනිශ්චය නොකරමි. එහෙත් මා විනිශ්චය කළත් මාගේ විනිශ්චය සැබෑය. මන්ද මා විනිශ්චය කරන්නේ තනියම නොව, මා එවා වදාළ පියාණන් වහන්සේ සමඟ ය. දෙදෙනෙකුගේ සාක්ෂිය වලංගු ය” යි ඔබේ ව්‍යවස්ථාවේ ලියා ඇත. මම මා ගැනම සාක්ෂි දරමි. මා එවා වදාළ පියාණන් වහන්සේ ද මා ගැන සාක්ෂි දරන සේකැ”යි වදාළ සේක. එබැවින් ඔව්හු “ඔබේ පියා කොහේදැ”යි ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් “ඔබ මා හඳුනන්නේ නැත. මාගේ පියාණන් හඳුනන්නේත් නැත. ඔබ මා හඳුනන්නහු නම් මාගේ පියාණන් වහන්සේත් හඳුනනවා ඇතැ”යි වදාළ සේක.

උන් වහන්සේ මේ වචන වදාළේ දේව මාළිගයේ උගන්වන අතර, පඬුරු ගබඩාවේ දී ය. එහෙත් කිසිවෙක් උන් වහන්සේ අල්ලා ගත්තේ නැත. මන්ද උන් වහන්සේගේ නියමිත මොහොත ඒ තාක් නොපැමිණි බැවිනි.

සුවිශේෂ වාක්‍යය එසේ ය.